# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2132/18 - 2019 ජූලි මස 19 වැනි සිකුරාදා - 2019.07.19**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනත**

57 වන වගන්තිය යටතේ නියෝගය

1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනතේ 57 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව විදුලිබල, බලශක්ති හා ව්‍යාපාර සංවර්ධන අමාත්‍ය රවී කරුණානායක වන මම ලංකා විදුලිබල මණ්ඩලයට අවශ්‍ය වී ඇති මෙහි උපලේඛනයේ විස්තර කර ඇති ඉඩම අත්පත් කර ගැනීමේ යෝජනාව මෙම නියෝගය මගින් අනුමත කරමි.

රවී කරුණානායක,<br>
විදුලිබල, බලශක්ති හා ව්‍යාපාර සංවර්ධන අමාත්‍ය.

2019 ජූලි මස 11 වැනි දින.

**උපලේඛනය**

ශ්‍රී ලංකාද්වීපයේ දකුණු පළාතේ, ගාල්ල පරිපාලන දිස්ත්‍රික්කයේ, නියාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ අංක 34 දරන මත්තක ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, මත්තක ග්‍රාමයේ පිහිටි බෙන්තොට වලල්ලාවිට කෝරලේ රජයේ වරලත් මිනින්දෝරුවරයකු විසින් පිළියෙල කරන ලද මූලික පිඹුර නො. 1061 දරන 2019.04.11 දිනැති සැලැස්මෙහි එක (1) හා දෙක (2) වශයෙන් දැක්වෙන පහත සඳහන් පරිදි මායිම් සහිත ප්‍රමාණයෙන් පර්චස් 21.7 ක් වූ ඉඩම්.

ලොට් අංක 01

*උතුරට* : හාතවිල කුඹුර<br>
*නැගෙනහිරට* : පාරට සමාන්තරව ඇති ඇළ මාර්ගය<br>
*දකුණට* : හාතවිල නින්දමුල්ල කුඹුර<br>
*බටහිරට* : මෙම සැලැස්මේ ලොට් අංක 02 ලෙස සටහන් කර ඇති කොටස<br>
*හිමිකම් කියන අය* : මාර්තුපිටිය ඇපාගේ කුලරත්න

ලොට් අංක 02

*උතුරට* : හාතවිල කුඹුර<br>
*නැගෙනහිරට* : මෙම සැලැස්මේ ලොට් අංක 01 ලෙස සටහන් කර ඇති කොටස<br>
*දකුණට* : හාතවිල නින්දමුල්ල කුඹුර<br>
*බටහිරට* : හාතවිල කුඹුර

*හිමිකම් කියන අය* : මාර්තුපිටිය ඇපාගේ කුලරත්න

08 - 146

1A - G 30534 — 27 (2019/07) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*